2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල

වැය ශීර්ෂය - **216-02-03-3-1501**

සමාජ සේවා දෙපාර්තමේන්තුව
දෙවන මහල
සෙත්සිරිපාය - II අදියර
බත්තරමුල්ල

2025 වර්ෂයේ දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදලේ කළමනාකරණ මණ්ඩලය සහ කාර්ය මණ්ඩලය

01. පූජ්‍ය ගලබොඩ ඥානීස්සර ස්වාමීන් වහන්සේ	- යාවජීව සාමාජික (අපවත් වී ඇත)
02. මලර්මදි ගංගාදරන් මහත්මිය	- සභාපති - දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල - ලේකම් - ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
සම්පත් මන්ත්‍රීනායක මහතා	- සභාපති - දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල - ලේකම් - ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
03. දර්ශනී කරුණාරත්න මහත්මිය	- සමාජ සේවා අධ්‍යක්ෂ
04. එන්.වයි.කොහොවල මෙනවිය	- ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් - අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය
05. අශෝක බන්ධුල වීරවර්ධන මහතා	- ලේකම්- ශ්‍රී ලංකා අන්ධ ජන සේවා මණ්ඩලය
06. කමල්සිරි නානායක්කාර මහතා	- සභාපති- ශ්‍රී ලංකා ජාතික දෘශ්‍යාබාධිත සම්මේලනය
07. එච්.ජේ.නිල්මිණි මහත්මිය	- සභාපති - ශ්‍රී ලංකා දෘශ්‍යාබාධිත ජනතා සම්මේලනය
රසික තිලක් ද සිල්වා මහතා	- ලේකම් - ශ්‍රී ලංකා දෘශ්‍යාබාධිත ජනතා සම්මේලනය
08. ගණුමිනි සුමනසේන මහතා	- සිංහ සමාජ නියෝජිත - දිස්ත්‍රික් 306 B2 සිංහ සමාජය
09. නිරීක්ෂක සුගත් වසන්ත ද සිල්වා	- සභාපති - ශ්‍රී ලංකා දෘශ්‍යාබාධිත උපාධිධාරී මණ්ඩලය

නිලධාරී මණ්ඩලය

01. ඊ.ඒ.වයි.එදිරිසිංහ මහතා	- ලේකම් - දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල
ඊ.එම්.සී.ඩී සිරිවර්ධන මහත්මිය	- ලේකම් - දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල
02. ජේ.එල්.අතුකෝරාළ මෙනවිය	- භාණ්ඩාගාරික - දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල
එම්.එච්.වයි.සී සූරියප්පෙරුම මහත්මිය	- භාණ්ඩාගාරික - දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල
03. ජී. දිනූෂා සන්දීපනී මෙනවිය	- කළමනාකාර සහකාර නිලධාරී
04. කේ.ඩබ්.ආර්.ඉරේෂා මහත්මිය	- කළමනාකාර සහකාර නිලධාරී

පටුන

පරිච්ඡේදය 01 - අරමුදලේ පැතිකඩ

1.1. හැඳින්වීම
1.2. නෛතික පසුබිම
1.3. පරමාර්ථ
1.4. ආයතනයේ දැක්ම , මෙහෙවර
1.5. අරමුදලේ ප්‍රධාන කාර්යයන්
1.6. සංවිධාන සටහන

පරිච්ඡේදය 02 - අරමුදලේ වාර්ෂික කාර්යසාධනය

2.1. දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල - මූල්‍ය ප්‍රගතිය
2.2. භෞතික කාර්යසාධන දත්ත
2.3. පනතේ පරමාර්ථ හා අනුගත වීම
2.4. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය
2.5. විශේෂ ජයග්‍රහණ

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

පරිච්ඡේදය 01

ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

2012 ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ සමීක්ෂණ වාර්තාවට අනුව මිලියන 1.6 කට ආසන්න දෘශ්‍යාබාධිත ප්‍රජාවක් මෙරට තුළ වෙසෙන බව සඳහන්ව ඇත. ඒ අනුව ලක්ෂ 16 කට ආසන්න ප්‍රමාණයක් දෘශ්‍යාබාධිත හෙවත් පෙනීමේ අපහසුතා ඇති පුද්ගලයින් බව සනාථ වී ඇත. මෙය සමාජය තුළ විශාල කොටසක් ලෙසින් සලකනු ලබන අතර, ඔවුන්ගේ ජීවිත තත්ත්වය,අධ්‍යාපනය, ආර්ථික දායකත්වය සහ සමාජීය සම්බන්ධතා පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් ඔවුන් සවිබල ගැන්වීම කළ යුතුය.

ඉතිහාසය තුළ දෘශ්‍යාබාධිත ප්‍රජාව තමන්ගේ දක්ෂතා, කැපවීම සහ අඛණ්ඩ උත්සාහය තුළින් රටේ ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමට විශාල දායකත්වයක් ලබා දී ඇත. උසස් අධ්‍යාපනය ලබන පිරිස අනෙකුත් ආබාධිත තත්ත්වයන්ට සාපෙක්ෂව ඉහළ අගයක් ගැනීම, විවිධ කර්මාන්තවල නිරතවීම, විවිධ රැකියාවල නියැළීම සහ දේශීය නිෂ්පාදන ක්ෂේත්‍රවල සෘජු දායකත්වය ඔවුන්ගේ කාර්යක්ෂමතාවය සහ ජාතික නිෂ්පාදනයේ වැදගත්කම තහවුරු කරනු ලබයි. විශේෂයෙන්ම අතීතයේදී දේශීය අත්යන්ත්‍ර රෙදිපිළි කර්මාන්තය ඔවුන්ගේ ආර්ථික ජීවිතයේ මූලික මාර්ගයක් වී, ජාතික නිෂ්පාදනයේ ගුණාත්මකභාවය උසස් කිරීමට උපකාරී විය.

1977 වර්ෂයේ හඳුන්වාදුන් විවෘත ආර්ථික ප්‍රතිපත්තිය සමග, දෘශ්‍යාබාධිත ප්‍රජාවට තමන් සතුව පැවති ස්වාධීන ආර්ථික උත්පාදන ක්‍රියාවලියට විවිධ බාධා ඇතිවිය. තරඟකාරී වෙළඳපොළේ බලපෑම හමුවේ ඔවුන්ගේ නිෂ්පාදන අලෙවිය බිඳවැටීම ආරම්භ විය. තරඟකාරීත්වය හමුවේ ඔවුන්ගේ ආබාධය විශේෂ අපහසුතාවයක් වී, ජීවිතය ගොඩනගා ගැනීමේ ක්‍රියාවලියට බාධාකාරී තත්ත්වයන් ඇති කළේය.

ශ්‍රී ලංකාව තුළ ආබාධ සහිත පුද්ගලයන් පිලිබඳ නව ආකල්ප වර්ධනය ක්‍රමයෙන් ආරම්භ වූයේ 1981 වර්ෂය ජාත්‍යන්තර ආබාධිත වර්ෂය ලෙස ප්‍රකාශයට පත් කිරීමත් සමගය. ඒ අනුව යමින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව මගින් 1992 අංක 9 දරණ ‘‘දෘශ්‍යාබාධිතයන් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල’’ නමින් පනතක් සම්මත කර රජයේ ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කොට ඇත. මෙම පනතට සමගාමීව ශ්‍රී ලංකාවේ වෙසෙන දෘශ්‍යාබාධිත පුද්ගලයන් වෙනුවෙන් ශ්‍රී ලංකා රජයේ විවිධ සේවාවන් ආරම්භ කරන ලදී. මෙම පනත මගින් දෘශ්‍යාබාධිත තත්ත්වයට පත්වන පුද්ගලයන්ට අවශ්‍ය සේවා සැපයීම, පුනරුත්ථාපනය කිරීම හා සහන ලබා දීම මෙම අරමුදලේ මෙහෙවර වේ. ආබාධ සහිත පුද්ගලයන් සඳහා සමාන අවස්ථා ලබා දීම පිලිබඳ එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය මගින් සම්මත කර ගත් නීති රීති වලට අදාලව කටයුතු කිරීම මෙහි පදනමයි.

වර්තමානයේ සමාජ සේවා දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ 216 යටතේ වාර්ෂික අයවැය ලේඛනය මගින් අරමුදල් වෙන් කරමින් කළමනාකරණ මණ්ඩලයක් යටතේ අරමුදල ක්‍රියාත්මක වේ. කළමනාකරණ මණ්ඩලය මසකට වරක් රැස්වේ. මෙහිදී දෘශ්‍යාබාධිත ප්‍රජාව නියෝජනය කරමින් පනත මගින් නම්කර ඇති දෘශ්‍යාබාධිත සංගම් 03 ක සාමාජිකයින් 04 දෙනෙකු කළමනාකරණ මණ්ඩලයට සහභාගි වන අතර පනත මගින් නම් කර ඇති නිල තනතුරු සහ අනෙකුත් සාමාජිකයින් සමග එක්ව, දෘශ්‍යාබාධිත ප්‍රජාව වෙනුවෙන් උපරිම සේවාවක් සැලසීම අරමුණු කර ගෙන තීන්දු තීරණ ගැනීම හා ක්‍රියාත්මක කිරීම සිදු කිරීමට කටයුතු කරනු ලබයි.

එහි ක්‍රියාකාරීත්වය හා ප්‍රගතිය සාකච්ඡාවට බඳුන් කිරීම සඳහා මෙම කාර්යසාධන වාර්තාව ඉදිරිපත්කරන අතර එමගින් වර්තමානයේ අරමුදල හරහා ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්, ව්‍යාපෘති පිළිබඳව 2025 වර්ෂයට අදාළව සමස්ත කාර්යසාධනය ඉදිරිපත් කෙරේ.

1.2. නෛතික පසුබිම

1992 අංක 9 දරණ දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල පනත දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදලක් පිහිටුවීම සඳහා ද, එහි පරමාර්ථ හා බලතල නිශ්චය කොට දැක්වීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ අනුශාංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි. වර්තමානයේ මෙම අරමුදල ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය යටතේ ඇති සමාජ සේවා දෙපාර්තමේන්තුව තුළ ස්ථාපනය කොට ඇත.

1.3. පරමාර්ථ

පනතේ 5 ඡේදය අනුව දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදලේ පරමාර්ථ පහත සඳහන් පරිදි වේ.

(අ) දෘශ්‍යාබාධිත තැනැත්තන් සඳහා අධ්‍යාපනික සහ වෘත්තීය පුහුණු පහසුකම් සැපයීම

(ආ) දෘශ්‍යාබාධිත තැනැත්තන් සඳහා සේවා නියුක්ති අවස්ථා ඇති කිරීම සහ අවශ්‍ය අවස්ථාවන්හීදී ඔවුන්ට ස්වයංරැකියා සඳහා මූල්‍යාධාර සහ මාර්ගෝපදේශකත්වය සැපයීම

(ඇ) දෘශ්‍යාබාධිත තැනැත්තන් සඳහා ශාස්ත්‍රීය පාඨමාලා හැදෑරීමට හෝ වෘත්තීය පුහුණුව ලබා ගැනීමට හැකිවනු පිණිස ඔවුන්ට නේවාසික පහසුකම් සැපයීම

(ඈ) දෘශ්‍යාබාධිත තැනැත්තන්ගේ සුභසාධනය පිණිස යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම

(ඉ) දෘශ්‍යාබාධිත තැනැත්තන් විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ සඳහා අලෙවි පහසුකම් සැපයීම

(ඊ) සමාන අයිතිවාසිකම් සහ සමාන අවස්ථා ලබා ගැනීමෙන් දෘශ්‍යාබාධිත තැනැත්තන් වලක්වාලන තත්ත්වයන් නැති කිරීමට ක්‍රියා කිරීම

1.4. දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදලේ දැක්ම සහ මෙහෙවර

දැක්ම

දෘශ්‍යාබාධිත තැනැත්තන් සඳහා අභිමානයෙන් යුත් ස්වාධීන ජීවිතයක්

මෙහෙවර

දෘශ්‍යාබාධිත තැනැත්තන් සඳහා සමානත්වය හා සමාන සහභාගීත්වය ලබාදීම සඳහා අවශ්‍ය සහය ලබාදීම මෙන්ම දෘශ්‍යාබාධිත තත්වයට පත්වන පුද්ගලයින් එයින් මුදවා ගැනීමට කටයුතු යෙදීම, පුනරුත්ථාපනය, ඔවුන් විෂයෙහි සුභසාධනය සැලසීම

1.5. අරමුදලේ ප්‍රධාන කාර්යයන්

1. ක්‍රීඩා ආධාර ලබා දීම

* දෘශ්‍යාබාධිත පුද්ගලයින් සඳහා හෝ දෘශ්‍යාබාධිත පුද්ගල සංවිධාන සඳහා හෝ දෘශ්‍යාබාධිත සිසුන් අධ්‍යාපනය ලබන විශේෂ පාසැල් සඳහා ක්‍රීඩා ආධාර ලබා දීම

2. අධ්‍යාපන හා සංස්කෘතික ආධාර ලබා දීම

* දෘශ්‍යාබාධිත පාසැල් සිසුන්, දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල සිසුන් සහ දෘශ්‍යාබාධිත දෙමාපියන්ගේ දෘශ්‍යාබාධිත නොවන දරුවන් සඳහා ශිෂ්‍යාධාර ලබා දීම

* දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල සිසුන් සඳහා තාක්ෂණික උපකරණ ලබා දීම

* බ්‍රේල් රයිටර් ලබා දීම

3. **පුනරුත්ථාපන ආධාර ලබා දීම**

* පසුකාලීනව දෘශ්‍යාබාධිතභාවයට පත් පුද්ගලයින් පුනරුත්ථාපනය කොට සමාජගත කිරීමේ වැඩසටහන

* සාමාන්‍ය අකුරින් මුද්‍රිත පොත් කථන ග්‍රන්ථ බවට පත් කිරීමේ කථන පුස්තක සැකසීමේ වැඩසටහන

* දෘශ්‍යාබාධිත පුද්ගලයින්ගේ නිවාස සඳහා විදුලිබලය සහ පානීය ජලය සපයා ගැනීම සඳහා ආධාර ලබා දීම


4. දෘශ්‍යාබාධිත තත්ත්වයට පත්වීම වැලැක්වීමේ අරමුණින් වයස අවුරුදු 60 ට අඩු පුද්ගලයින් සඳහා අක්ෂි කාච හා අක්ෂි ප්‍රතිකාර සඳහා ආධාර ලබා දීම

5. ජාත්‍යන්තර සුදු සැරයටි සුරක්ෂා දින සැමරුම් ජාතික වැඩසටහන පැවැත්වීම

6. විශේෂ ඉල්ලීම්වලට අනුව වෘත්තීය පුහුණු ආයතනවල සහ දෘශ්‍යාබාධිත සිසුන් අධ්‍යාපනය ලබන පාසැල්වල උපදේශකවරුන් සඳහා (තාවකාලික) දීමනා ලබා දීම

7. ස්වයං රැකියා ආධාර ලබා දීම

1.6. සංවිධාන සටහන


සභාපති
ලේකම් - ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
යාවජීව සාමාජික
පූජ්‍ය ගලබොඩ ඥානීස්සර ස්වාමීන් වහන්සේ
සමාජික 1
සමාජ සේවා අධ්‍යක්ෂ
සමාජික 1
අග්‍රාමාත්‍ය ලේකම් හෝ නියෝජිත
සමාජික 1
සිංහ සමාජ නියෝජිත
සමාජික 2
ශ්‍රී ලංකා දෘශ්‍යාබාධිත ජනතා සම්මේලනය
ලේකම්
සභාපති
සමාජික 1
ශ්‍රී ලංකා අන්ධ ජන සේවා මණ්ඩල නියෝජිත
සමාජික 1
ශ්‍රී ලංකා ජාතික දෘශ්‍යාබාධිත සම්මේලන නියෝජිත
කාර්ය මණ්ඩලය
ලේකම්
භාණ්ඩාගාරික
කළමනාකරණ සහකාර නිලධාරී
කළමනාකරණ සහකාර නිලධාරී

පරිච්ඡේදය 02

අරමුදලේ වාර්ෂික කාර්යසාධනය

2.1. දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල - මූල්‍ය ප්‍රගතිය

වැය ශීර්ෂය **216-02-03-3-1501 (2025/12/31** දිනට)

අනු අංකය	වැඩසටහන	භෞතික ප්‍රගතිය	ඇස්තමේන්තුව රු.	වියදම රු.
01	**අධ්‍යාපන හා සංස්කෘතික ආධාර**		10,342,414.00	8,839,972.00
	i. දෘශ්‍යාබාධිත පාසල් සිසුන් සහ දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල සිසුන් සඳහා ශිෂ්‍යාධාර ලබාදීම ii. දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල සිසුන් සඳහා සුහුරු ජංගම දුරකතන ලබා දීම iii. දෘශ්‍යාබාධිත පාසල් සිසුන් සඳහා බ්‍රේල් රයිටර් ලබා දීම	සිසුන් 303 18 3		
02	**වෘත්තීය පුහුණු**	පුහුණුලාභීන් 3	130,000.00	78,000.00
03	**පුනරුත්ථාපන ආධාර**		1,871,000.00	1,870,621.00
	i. උපදේශක දීමනා	උපදේශකවරුන් 05		
	ii. පුහුණුලාභීන් සඳහා ශිෂ්‍ය දීමනා	පුහුණුලාභීන් 19		
	iii.විදුලිය හා පානීය ජලය ලබාදීම්	ප්‍රතිලාභීන් 01		
	iv. කථන පුස්තක	මුද්‍රිත පිටු 32,000 කට අඳාල පුස්ථක		
04	**අක්ෂි කාච හා අක්ෂි ප්‍රතිකාර**	අක්ෂි කාච 04	400,000.00	102,847.00
05	**සුදු සැරයටි දින සැමරුම් ජාතික උත්සවය**	උත්සව 01	3,266,586.00	3,266,585.34
06	**ස්වයං රැකියා ආධාර**	පුද්ගලයින් 10	440,000.00	440,000.00
07	**ක්‍රීඩා ආධාර**	පාසල් 10	700,000.00	499,000.00
08	**දෘශ්‍යාබාධිත සංවිධාන ඉල්ලීම්**		200,000.00	47,381.25
09	**පරිපාලන හා අනෙකුත් වියදම්**		1,367,000.00	1,288,472.29
10	**විගණන ගාස්තු**		175,000.00	168,504.00
11	**මූල්‍ය වියදම්**		3,000.00	-
12	**විවිධ වියදම්**		105,000.00	71,751.13
එකතුව			**19,000,000.00**	**16,673,134.01**

2.2. භෞතික කාර්යසාධන දත්ත

විස්තරය	2025 වර්ෂය අවසානයේ භෞතික කාර්ය සාධනය
1. පවත්වන ලද කළමනාකරණ මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව	07
2. අධ්‍යාපන හා සංස්කෘතික ආධාර i. දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල සිසුන් සඳහා තාක්ෂණික උපකරණ ලබා දීම ii. බ්‍රේල් රයිටර්ස් ලබා දීම	303 18 3
3. පුනරුත්ථාපන ආධාර ශ්‍රී ලංකා අන්ධ ජන සේවා මණ්ඩලය මගින් පවත්වනු ලබන පසුකාලීනව දෘශ්‍යාබාධිත බවට පත්වූවන් සඳහා පවත්වනු ලබන පුනරුත්ථාපන වැඩසටහන i. උපදේශකවරුන් ii. පුහුණුලාභීන් iii. සාමාන්‍ය අකුරින් ලියැවුන පොත් කථන මාධ්‍ය පොත් බවට පත් කිරීමේ කථන පුස්තක ව්‍යාපෘතිය	05 19 මුද්‍රිත පිටු 32000
4. ජාත්‍යන්තර සුදු සැරයටි දින සැමරුම් ජාතික උත්සවය සුදු සැරයටි දිනයට සමගාමීව දෘශ්‍යාබාධිත වූවන් සඳහා දීප ව්‍යාප්ත ගීත ගායනා තරඟාවලියක් පැවැත්වීම	01 01
5. විවිධ ආධාර i. දෘශ්‍යාබාධිත පුද්ගලයින්ගේ නිවාස සඳහා පානීය ජලය ලබා දීම	01
6. අක්ෂි කාච හා අක්ෂි ප්‍රතිකාර ලබා දීම	04
7. ස්වයං රැකියා ආධාර ලබා දීම	10

2.3. පනතේ පරමාර්ථ හා අනුගත වීම

අනු අංකය	පරමාර්ථය	ක්‍රියාකාරකම්
01	දෘශ්‍යාබාධිතයන් සඳහා අධ්‍යාපනික සහ වෘත්තීය පුහුණු පහසුකම් සැපයීම	i. 1 වසර සිට අ.පො.ස. (සා.පෙළ) දක්වා දෘශ්‍යාබාධිත සිසුන් සඳහා ශිෂ්‍යාධාර ii. අ.පො.ස.(උ.පෙළ) දක්වා දෘශ්‍යාබාධිත සිසුන් සඳහා ශිෂ්‍යාධාර iii. විශ්වවිද්‍යාල සිසුන් සඳහා ශිෂ්‍යාධාර iv. දෘශ්‍යාබාධිත දෙමාපියන්ගේ දෘශ්‍යාබාධිත නොවන දරුවන් සඳහා ශිෂ්‍යාධාර v. දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල සිසුන් සඳහා තාක්ෂණික උපකරණ ලබා දීම
02	දෘශ්‍යාබාධිතයන්ගේ සුභසාධනය පිණිස යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම	i. අක්ෂි කාච හා අක්ෂි ප්‍රතිකාර සඳහා ආධාර ලබා දීම ii. පුනරුත්ථාපන ආධාර ලබාදීම (පසුකාලීනව දෘශ්‍යාබාධිත භාවයට පත්වූවන් පුනරුත්ථාපනය කොට සමාජ ගත කිරීම) iii. දෘශ්‍යාබාධිත පුද්ගලයින්ගේ නිවාස සඳහා විදුලිය හා පානීය ජලය ලබා දීම
03	සමාන අයිතිවාසිකම් සහ සමාන අවස්ථා ලබා ගැනීමෙන් දෘශ්‍යාබාධිත තැනැත්තන් වලක්වාලන තත්ත්වයන් නැති කිරීමට ක්‍රියා කිරීම	i. කථන පුස්තක සැකසීම සඳහා ආධාර ලබා දීම ii. ජාත්‍යන්තර සුදු සැරයටි සැමරුම් ජාතික උත්සවය පැවැත්වීම

2.4. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

	ඉලක්කය/අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
				0% - 49%	50% - 74%	75% - 100%
4.5	අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කම් තුරන් කිරීම, අධ්‍යනයේ සියලුම මට්ටම්වලට ප්‍රවේශ වීමේ අවස්ථාව තහවුරු කිරීම සහ ආබාධිත පුද්ගලයින්ට,ස්වදේශිකයින්ට සහ අවදානමට ලක්විය හැකි ළමුන්ට වෘත්තීය පුහුණුව ලබා ගැනීමට අවස්ථාව සැලසීම	පාසැල් අධ්‍යාපනය සහ විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන දෘශ්‍ය බාධිත ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා ශිෂ්‍යාධාර මුදල් ලබා දීම	ශිෂ්‍යාධාර ලබාගත් ශිෂ්‍ය සංඛ්‍යාව			√
		දෘශ්‍යාබාධිත දෙමාපියන්ගේ පාසැල් අධ්‍යාපනය ලබන දෘශ්‍යාබාධිත නොවන දරුවන් සඳහා ශිෂ්‍යාධාර මුදල් ලබා දීම	ශිෂ්‍යාධාර ලබාගත් ශිෂ්‍ය සංඛ්‍යාව			√
		විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන දෘශ්‍යාබාධිත උපාධි අපේක්ෂකයින් සඳහා තාක්ෂණික උපකරණ ලබා දීම (ජංගම දුරකථන)	තාක්ෂණික උපකරණ ලබාගත් උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව		√	

10.2	වයස, ලිංගිකත්වය, ආබාධිතබව, ජන වර්ගය, ජාතිය, ආගම හෝ ආර්ථික හෝ වෙනත් තත්ත්වයන් පිළිබඳව තැකීමකින් තොරව සියලු දෙනාගේ සමාජ, ආර්ථික සහ දේශපාලනික අන්තර්කරණය සවිබල ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම	පසුකාලීනව දෘශ්‍යාබාධිතභාවයට පත් වූ පුද්ගලයින් පුනරුත්ථාපනය කර සමාජගත කිරීමේ වැඩසටහන් සඳහා අධාර ලබා දීම	පුනරුත්ථාපන වැඩසටහන සඳහා සහභාගී වූ පුද්ගල සංඛ්‍යාව			√
		දෘශ්‍යාබාධිත පුද්ගලයින්ගේ සංචාරක මෙවලම වන සුදු සැරයටිය පදනම් කර ගනිමින් ජාත්‍යන්තර සුදු සැරයටි සුරක්ෂා දින සැමරුම් ජාතික උත්සවය	උත්සවය සඳහා සහභාගී වූ දෘශ්‍යාබාධිත පුද්ගල සංඛ්‍යාව			√

2.5 විශේෂ ජයග්‍රහණ

- දෘශ්‍යාබාධිත ගායක ගායිකාවන්ගේ ගායන හැකියාව ඔප්නැංවීම වෙනුවෙන් දීපව්‍යාප්ත ගීත ගායනා තරඟාවලියක් පැවැත්වීම.
- 2025 වර්ෂය තුළ දෘශ්‍යාබාධිත දරුවන් 303 ක් වෙනුවෙන් ශිෂ්‍යත්ව හා තාක්ෂණික උපකරණ ලබාදීමට හැකි වීම.
- දෘශ්‍යාබාධිත පුද්ගලයින්ගේ කලා හැකියාව ඔප්නැංවීමේ අරමුණින් දෘශ්‍යාබාධිත නිර්මාණකරුවන් වෙනුවෙන් වෙබ් නිර්මාණ පිටුවක් නිර්මාණය කිරීම
- දෘශ්‍යාබාධිත පුද්ගලයින්ගේ නිෂ්පාදන මාර්ගගත ක්‍රමය ඔස්සේ අලෙවි කිරීම සඳහා මාර්ගගත වෙළඳපොළක් නිර්මාණය කිරීම.

2.6 අභියෝග

- උපතින් හෝ පසුකාලීනව දෘශ්‍යාබාධිත තත්ත්වයට පත් වූ කණ්ඩායම් සඳහා සිදුකරනු ලබන වැඩසටහන් වලදී එම සේවාලාභීන් සහභාගී කර ගැනීමේදී ප්‍රවාහන දුෂ්කරතා වලට මුහුණ දීමට සිදුවේ.
- එසේම තනිව ජීවත් වන පුද්ගලයින් සඳහා සහායකයින් නොමැති වීම හේතුවෙන් ඔවුන් වෙත යම් ප්‍රතිලාභයන් ගලා නොයාම.
- සාමාන්‍ය පාසැල් වල ඉගෙනුම ලබන දෘශ්‍යාබාධිත ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා ක්‍රීඩා තරඟ වැනි විශේෂ අවස්ථා අහිමි වීම. එසේම අරමුදල මගින් ලබා දෙන විශේෂ පාසැල් වල අධ්‍යාපනය ලබන සිසුන් සඳහා ක්‍රීඩා උපකරණ ලබාදීම වැනි ආධාර වල ප්‍රතිලාභයන් ඔවුන් වෙත නොලැබීම.

2.7 ඉලක්ක

- දිවයින පුරා වෙසෙන සමස්ත දෘශ්‍යාබාධිත ප්‍රජාව ඉලක්ක කරමින් සේවා සැපයීම පුළුල් කිරීම.
- විශේෂ පාසල් වල අධ්‍යාපනය ලබන දෘශ්‍යාබාධිත ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ක්‍රීඩා කෞශල්‍ය දියුණු කිරීම.
- දිවයිනපුරා විසිරී සිටින ස්වයං රැකියා සිදුකරන පුද්ගලයින් සඳහා ව්‍යවසායකත්ව පුහුණු වැඩමුලු පැවැත්වීම.

සභාපති
දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන හාර අරමුදල

නම -

තනතුර -

දිනය -

පරිච්ඡේදය 03

දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල
2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

	2025	2024
<u>මෙහෙයුම් ආදායම</u>		
රජයේ ප්‍රධාන	16,673,134.08	9,000,000.00
වෙනත් ලැබීම්	-	424,882.00
පරිත්‍යාග ලැබීම්	996,762.00	-
ස්ථාවර තැන්පත් පොළිය	371,434,64	286,169.77
	18,041,330.72	9,711,051.77
<u>මෙහෙයුම් වියදම්</u>		
ක්‍රීඩා ආධාර	499,000.00	110,000.00
වෘත්තීය පුහුණු වියදම්	84,000.00	-
අධ්‍යාපන හා සංස්කෘතික ආධාර	8,885,972.00	5,280,400.00
පුනරුත්ථාපන ආධාර	1,384,682.00	1,021’338.00
පරිපාලන වියදම්	1,286,402.29	1,064,770.06
අක්ෂි කාච හා අක්ෂි ප්‍රතිකාර	102,847.00	51,650.00
විගණන ගාස්තු	168,504.00	162,840.00
මූල්‍ය වියදම්	-	-
විවිධ වියදම්	71,751.13	31,573.00
සුදු සැරයටි දින වියදම්	3,272,585.34	725,908.00
ස්වයං රැකියා ආධාර	560,000.00	-
දෘශ්‍යාබාධිත සංවිධාන ඉල්ලීම්	47,381.00	-
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය / හිඟය	**16,363,125.01**	**8,448,479.06**
	1,678,205.71	1,262,572.71

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2025 රු.	2024 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
සාමාන්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ අතිරික්තය/හිඟය	**1,678,205.71**	**1,262,572.71**
ජංගම වගකීම්වල වැඩිවීම		
සුදු සැරයටි දින වියදම්	6,000.00	-
අධ්‍යාපන හා සංස්කෘතික ආධාර වියදම්	46,000.00	48,100.00
පුනරුත්ථාපන ආධාර	6,000.00	-
රඳවා ගැනීමේ බද්ධ	10,550.88	-
ස්වයං රැකියා ආධාර	120,000.00	-
ජංගම වගකීම්වල අඩුවීම		
පුනරුත්ථාපන වියදම්	(485,939.00)	(74,775.00)
සුදු සැරයටි දින වියදම්	-	(10,000.00)
වෘත්තීය පුහුණු	-	(22,000.00)
පරිපාලන වියදම්	(2,070.00	-
ජංගම වත්කම්වල වැඩිවීම		
ස්ථාවර තැන්පත්	(1,290,238.57)	(2,786,169.77)
ලැබී ඇති පොළිය	(105,508.82)	-
අනුග්‍රාහකත්ව ලැබීම්	(39,600.00)	-
ජංගම වත්කම්වල අඩුවීම	-	-
ලාභයට පසුගිය වසරෙන් ගලපන ලද මුදල (2021,2022,2023)	128,600.00	222,695.00
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**72,000.20**	**(1,359,577.06)**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ඇති වන මුදල් ප්‍රවාහය	-	-
මූල්‍ය ප්‍රතිපාදන ක්‍රියාකාරකම් වලින් ඇති වන මුදල් ප්‍රවාහය	-	-
වර්ෂය තුළ මුළු මුදල් ආදායම්/ප්‍රවාහ හා ගෙවීම්/ප්‍රවාහ	**72,000.20**	**(1,359, 577.06)**
වර්ෂ මුල මුදල් හා මුදල්වලට සමාන දෑ	1,383,222.56	2,742,799.62
වර්ෂ අවසාන මුදල් හා මුදල්වලට සමාන දෑ	**1,455,222.76**	**1,383,222.56**

2025 දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය


	2025 රු	2024 රු
වත්කම්		
ජංගම වත්කම්		
බැංකු ශේෂය	1,455,222.76	1,383,222.56
පොළී ලැබීම්	105,508.82	-
අනුග්‍රාහකත්ව ලැබීම්	39,600.00	-
ස්ථාවර තැන්පත්	6,707,158.53	5,416,919.96
මුළු වත්කම්	**8,307,490.11**	**6,800,142.52**
වගකීම්		
-		
උපචිත වියදම්	928,561.00	1,238,570.00
රඳවා ගැනීමේ බදු	10,550.88	-
මුළු වගකීම්	939,111.88	1,238,570.00
මුළු ශුද්ධ වත්කම්	**7,368,378.23**	**5,561,572.52**
හිමිකම		
සමුච්චිත අරමුදල	**5,690,172.52**	**4,298,999.81**
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය	1,678,205.71	1,262,572.71
මුළු ශුද්ධ හිමිකම	**7,368,378.23**	**5,561,572.52**

භාණ්ඩාගාරික
දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } එල්එස්ඩබ්/ඩී/විඑවිඑඑ/එෆ්එස්/2025 මබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2025 මැයි 19 දින



සභාපති,

දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල

දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදලේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

කේ.කේ.එස්.ජයකොඩි
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත - 01. ලේකම් - ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීමේ අමාත්‍යාංශය

02.ලේකම් - මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එල්එස්ඩබ්/ඩී/විඑවිටිඑෆ්/ එෆ්එස්/2025

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2026 මැයි 11 දින

සභාපති,
දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ හාර අරමුදල

දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ හාර අරමුදලේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ හාර අරමුදලේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාල තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට ගෙවිය යුතු පුනරුත්ථාපන ආධාර ශේෂය රු.696,500 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී ඉන් රු. 685,939 ක් ගෙවා නිබුණි. එම ගෙවූ මුදල තුළ ඇතුළත් වූ රු.200,000 ක් සමාලෝචිත වර්ෂයට අදාළ පුනරුත්ථාපන ආධාර ගෙවීමක් ලෙස සලකා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි මෙහෙයුම් වියදම් යටතේ දක්වා නිබීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි උපචිත වියදම් ද එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා නිබුණි. ඒ අනුව වර්ෂයේ අතිරික්තය හා ශුද්ධ වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා නිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනයකළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ லேன், பத்தரமுல்ல, இலங்கை | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය නිරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) 2025 දෙසැම්බර් 10 දිනැති අංක TO/CFM/01/06/02(i) දරන භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු ලිපියෙහි 04 ඡේදයෙහි ඇතුළත් ජාතික අයවැය චක්‍රලේඛ 01/2024 හි අංක 11, රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 01/2024 හි අංක 14	2024 වර්ෂයේ දී භාණ්ඩාගාරයෙන් ලබා දී නිබුණු රු.මිලියන 09 ක ප්‍රදාන වලින් ඉතිරි වී නිබුණු රු. මිලියන 2.5 ක් ආපසු භාණ්ඩාගාරය වෙත යැවීමට කටයුතු නොකර ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර නිබුණි. සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් 24 දින එම ආයෝජනය කල්පිරී නිබුණු අතර ශේෂය රු. මිලියන 2.29 ක් වී නිබුණි. නැවත සමාලෝචිත වර්ෂයේදී එම මුදල සියයට 7.50 ක පොලී අනුපාතයක් යටතේ මාස 06 කින්

	කල්පිරෙන ලෙස ආයෝජනය කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් වක්‍රලේඛ පරිදි කටයුතු කර නොතිබුණි.
(ආ) ප්‍රසම්පාදන අත්පොත 2024 හි (2.4) (ආ) viii	සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 2.99ක් වූ ප්‍රසම්පාදනයන්ට අදාලව ලංසු ඇගයීම් වාර්තාව නිර්දේශ කිරීම, සමාලෝචනය කිරීම සහ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම පිළිබඳව නිර්ණය කිරීම ප්‍රසම්පාදන කමිටුව විසින් සිදු කළ යුතුව තිබුණද කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමට අදාළ අනුමැතිය ප්‍රසම්පාදන කමිටුව විසින් ලබා දී නොතිබුණි.

3.2 කාර්යසාධනය

අරමුදලේ ප්‍රධාන කාර්යයක් වන දෘශ්‍යාබාධිත තත්ත්වයට පත්වීම වැළැක්වීමේ අරමුණින් වයස අවුරුදු 60 ට අඩු පුද්ගලයින් සඳහා අක්ෂි කාච හා අක්ෂි ප්‍රතිකාර ලබාදීමට සැලසුම් කර පුද්ගලයින් 10 දෙනෙකු වෙනුවෙන් රු.මිලියන 0.4 ක් වෙන් කර තිබුණ ද රු.මිලියන 0.1 පමණක් වැය කර අක්ෂි කාච 03 ක් පමණක් ලබා දී තිබුණි. ප්‍රගතිය සියයට 25 ක් වැනි අවම මට්ටමක පැවතුණි.

3.3 කළමණාකරන ක්‍රියාකාරකම්

ගෙවිය යුතු අධ්‍යාපන හා සංස්කෘතික ආධාර වටිනාකම වූ රු.586,000 ක් තුළ ඇතුළත් 2022 හා 2023 වර්ෂයන් වල ගෙවීමට ඉදිරිපත් කළද ශිෂ්‍යාධාර හිමිකම් ලැබූ දෘශ්‍යාබාධිත ශිෂ්‍යයන් විසින් අදාළ ආධාර මුදල් ලබා ගැනීමට ඉදිරිපත් නොවීම හේතුවෙන් ආපසු එවන ලද චවුචර් පත් වටිනාකම රු.516,000 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

කේ.කේ.එස්.ජයකොඩි
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට